# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 6 දරන වෛද්‍ය
## (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 අප්‍රේල් මස 10 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 අප්‍රේල් මස 11 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2014 අංක 6 දරන වෛද්‍ය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2014 අප්‍රේල් මස 10 වන දින]

එල්.ඩී.—ඕ. 81/2006 (II)

**(105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2014 අංක 6 දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 105 වන අධිකාරයේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනු-ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(i) (අ) ලංකා විශ්ව විද්‍යාලයේ හෝ අනුරූප විශ්ව විද්‍යාලයක ;

(ආ) උපාධි ප්‍රදාන ආයතනයක ; හෝ

(ඇ) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්ව විද්‍යාලයේ,

වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් සහ 32 වන වගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන්නේ නම් ; හෝ ";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ —

(අ) (ආ) ඡේදයේ (i) වන අනු-ඡේදයේ "හෝ උපාධි ප්‍රදාන ආයතනයක" යන වචන වෙනුවට "හෝ උපාධි ප්‍රදාන ආයතනයක හෝ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්ව විද්‍යාලයේ" යන වචන ආදේශ කිරීමෙන් ; හෝ ;

(ආ) (ආ) ඡේදයේ (ii) වන අනු-ඡේදයේ "හෝ උපාධි ප්‍රදාන ආයතනයක" යන වචන වෙනුවට "හෝ උපාධි ප්‍රදාන ආයතනයක හෝ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්ව විද්‍යාලයේ" යන වචන ආදේශ කිරීමෙන්. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** "වතු ඇපෝතිකරිවරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්ව විද්‍යාලය" යන්නෙන් 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත යටතේ පිහිටුවනු ලැබූ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක විශ්ව විද්‍යාලය අදහස් වේ;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.